දුරකථන
தொலைபேசி
Telephones
} 011-2136600
011-2136650

ලේකම්
செயலாளர்
Secretary
} 011-2136602

ෆැක්ස්
தொலைநகல்
Fax
} 011-2876169
011-2876181

විද්‍යුත් තැපෑල
மின் - அஞ்சல்
E - mail
} info@psc.gov.lk

වෙබ් අඩවිය
இணையத்தளம்
Website
} www.psc.gov.lk

# රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය
# பகிரங்க சேவை ஆணைக்குழு அலுவலகம்
# OFFICE OF THE PUBLIC SERVICE COMMISSION

අංක 1200/9, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.
இல. 1200/9, இராஜமல்வத்தை வீதி, பத்தரமுல்லை.
No. 1200/9, Rajamalwatta Road, Battaramulla.

මගේ අංකය
எனது இல.
My No.
} PSC/APL/5/99/2025

ඔබේ අංකය
உமது இல.
Your No.
}

දිනය
திகதி
Date
} 2026.03. 13

ලේකම්
විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය

**<u>විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශයේ, සංවර්ධන නිලධාරී (විදේශ රැකියා) නිලධාරීන්ගේ 2026 වාර්ෂික අභ්‍යන්තර ස්ථානමාරු නියෝග සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති අභියාචනාවලට අදාළ තීරණ දැනුම් දීම</u>**

ඉහත සඳහන් සේවා කාණ්ඩයේ නිලධරයන් සම්බන්ධයෙන් ඔබ විසින් අනුමත කරන ලද 2026 වාර්ෂික අභ්‍යන්තර ස්ථාන මාරු නියෝගවලට එරෙහිව රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද අභියාචනා සලකා බැලීමෙන් පසු රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ලබාදුන් තීරණ www.psc.gov.lk දරණ රාජ්‍ය සේවා කොමිෂන් සභා වෙබ් අඩවියේ පළ කර ඇත.

02. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණ ලබා දී ඇති මෙම අභියාචනා අතරින් ක්‍රියාත්මක විය යුතු දිනය සම්බන්ධයෙන් විශේෂයෙන් සඳහන් කර නොමැති සියලු ස්ථාන මාරු 2026.04.02 දින සිට ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු කරන ලෙස ඔබ වෙත කාරුණිකව දන්වා සිටිමි. 2026 වාර්ෂික ස්ථාන මාරු ක්‍රියාත්මක වීම සඳහා වෙනත් නිශ්චිත දිනයක් ලබා දී ඇති ස්ථාන මාරුවීම් එකී නිශ්චිත දිනවල සිට ද අනිවාර්යයෙන්ම ක්‍රියාත්මක විය යුතු වේ. ඒ අනුව, 2026 වාර්ෂික ස්ථාන මාරුවීම් ලද නිලධාරීන් මේ සම්බන්ධයෙන් දැනුවත් කරන ලෙසත් මෙයින් දන්වමි.

03. එක් එක් නිලධාරියා සම්බන්ධයෙන් වෙන වෙනම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණ දන්වා එවීමට කටයුතු කරනු නොලැබේ. ඒ අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභා වෙබ් අඩවියේ ස්ථාන මාරු අභියාචනයන්ට අදාළ නියෝග ප්‍රසිද්ධ කිරීමට අවශ්‍ය පියවර ගනු ලබන අතර මේ සම්බන්ධයෙන් 2006 අංක 19 දරණ ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනතේ 2 (ඇ) සහ (ඈ), 3 සහ 4 යන වගන්ති කෙරෙහි ඔබගේ අවධානය යොමු කරනු ලැබේ.

04. රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද අභියාචනා සම්බන්ධයෙන් එම කොමිෂන් සභාව විසින් ලබා දී ඇති තීරණයකින් අතෘප්තියට පත්වන රජයේ නිලධරයකුට 2002 අංක 04 දරණ පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය පනතේ විධිවිධානවලට අනුකූලව පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය වෙත අභියාචනයක් ඉදිරිපත් කිරීමට හිමිකම් ඇත්තේය. එසේ වුවද, ඉදිරිපත් කරනු ලබන අභියාචනා සඳහා පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරයේ අවසන් තීරණයක් ලැබෙන තෙක් ලබා දී ඇති ස්ථාන මාරු නියෝගය එලෙසම ක්‍රියාත්මක විය යුතු බවද කාරුණිකව දැනුම් දෙමි.

05. 2026 වාර්ෂික අභ්‍යන්තර ස්ථාන මාරු නියෝග ලබා සිටින සියලුම නිලධාරීන් නියමිත දිනයේ නව සේවා ස්ථානයේ රාජකාරි භාර ගැනීමට හැකි වන පරිදි අනුප්‍රාප්තිකයින් පැමිණෙන තෙක් රඳවා නොගෙන වර්තමාන සේවා ස්ථානවලින් මුදා හැරීමට කටයුතු කිරීම ආයතන ප්‍රධානීන්ගේ වගකීම වන අතර, එය නිවැරදිව සිදු වන්නේද යන්න පිළිබඳව පුළුල් අධ්‍යයනයක් හා පසු විපරමක් සිදු කරන ලෙසද ඔබ වෙත දන්වා සිටිමි.

06. වාර්ෂික අභ්‍යන්තර ස්ථාන මාරු නියෝග මත නියමිත පරිදි පූර්ව සේවා ස්ථානයෙන් නිදහස් කරන ලද නමුත් නියමිත පරිදි නව සේවා ස්ථානය වෙත රාජකාරි සඳහා වාර්තා නොකර සිටින නිලධරයකු රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති 257 (V) වගන්තිය අනුව, සිය කැමැත්තෙන් තනතුර අතහැර ගියා සේ සලකා තනතුර අතහැරයාමේ නිවේදනයක් නිකුත් කිරීමට කටයුතු කළ යුතු අතර අදාළ ආයතන ප්‍රධානීන් එසේ කටයුතු කරන්නේද යන්න පිළිබඳව ඔබ විසින් අධීක්ෂණය කළ යුතු බව කාරුණිකව දන්වා සිටිමි.

07. එසේම රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණ ලබා දී ඇති ස්ථාන මාරු සම්බන්ධව ඉදිරියේදී ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් හෝ නිර්දේශ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නැවත සලකා නොබලන බව දන්වන අතර එවැනි ඉල්ලීම් හා නිර්දේශ තවදුරටත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් නොකරන ලෙසද වැඩිදුරටත් දන්වා සිටිමි.

Nday

**ඩබ්ලිව්.එච්.එම්.එම්.සී.කේ. දයාරත්න**
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව

# විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශ, සංවර්ධන නිලධාරී (විදේශ රැකියා) අභ්‍යන්තර ස්ථානමාරු අභියාචනා තීරණ - 2026

| අනු අංකය | ජා.හැ.අ. | නිලධාරියා නම | වර්තමාන සේවා ස්ථානය | නව සේවා ස්ථානය | රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය |
|---|---|---|---|---|---|
| 1 | 876461099V | ආර්.ජේ.එස්. දුල්ශාන්ති මහත්මිය | සෙවනගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | තණමල්විල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | අභියාචනය නිෂ්ප්‍රභ කිරීම<br>අදාල 2026 වාර්ෂික ස්ථාන මාරු චක්‍රය 2027.01.01 දින සිට ක්‍රියාත්මක කිරීම |
| 2 | 198673301689 | ඩබ්.ජේ.පී. වන්නිආරච්චි මහත්මිය | තණමල්විල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | සෙවනගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | අභියාචනයට ඉඩ දී ඇත.<br>අදාල 2026 වාර්ෂික ස්ථාන මාරු චක්‍රය 2027.01.01 දින සිට ක්‍රියාත්මක කිරීම |
| 3 | 198218002601 | ඊ.ආර්.එස්.පී.කේ. ඒකනායක මහතා | නොච්චියාගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | කරුවලගස්වැව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | අභියාචනය නිෂ්ප්‍රභ කිරීම |
| 4 | 750462227V | පී.එච්.ඩී. ජයසිංහ මහතා | නිවිතිගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | ඇලපාත ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | අභියාචනය නිෂ්ප්‍රභ කිරීම |
| 5 | 827063282V | ටී.ටී. පලිහක්කාර මහත්මිය | තිහගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | හබරාදූව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | අභියාචනය නිෂ්ප්‍රභ කිරීම |
| 6 | 198479302791 | එම්.ජේ.සමන්මලී මහත්මිය | පාදුක්ක ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | අභියාචනය නිෂ්ප්‍රභ කිරීම<br>අදාල 2026 වාර්ෂික ස්ථාන මාරු චක්‍රය 2026.09.01 දින සිට ක්‍රියාත්මක කිරීම |
| 7 | 836151798V | ටී. මෝහනසුන්දරි මහත්මිය | එරාවූර්පත්තු, වෙංකලඩි ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | - | අභියාචනය නිෂ්ප්‍රභ කිරීම |
| 8 | 198573203467 | ජේ. සිවාශිනී මහත්මිය | එරාවූර්පත්තු, වෙංකලඩි ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | - | අභියාචනය නිෂ්ප්‍රභ කිරීම |

2026/03/10

| | | | | | |
|---|---|---|---|---|---|
| 9 | 796912723V | ටී. පද්මසිරි මහත්මිය | මන්මුනෙයිපත්තු - අරියපත්ති ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | කෝරළපත්තු දකුණ කිරාන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | අභියාචනය නිෂ්ප්‍රභ කිරීම හැකියාව පවතී නම් සාමාන්‍ය ස්ථාන මාරු යටතේ ඉල්ලා ඇති සේවා ස්ථානයකට ස්ථාන මාරු ලබා දීම |
| 10 | 865611013V | ආර්.ෆස්මියා මහත්මිය | කින්නියා ප්‍රාදේශීය ලේකම් කාර්යාලය (තාවකාලික අනුයුක්තය - විදේශ සේවා නියුක්ති කාර්යාංශය - ත්‍රිකුණාමලය) | - | අභියාචනය නිෂ්ප්‍රභ කිරීම |

2026/03/10